**මැදදුම්බර ප්‍රාදේශීය සභාව.**
**මහනුවර දිස්ත්‍රික්කය.**
**------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන.

## 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරිම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මැයි 06 දින ද, ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 මැයි 11 දින ද විගණනයට ඉදිරිපත් කර තිබුණි. සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 ජුලි 22 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

## 1.2 තත්ත්වාගණනය කළ මතය.

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට මැදදුම්බර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ඉදි කිරීම් 09 ක් සඳහා සමාලෝචිත වර්ෂයේ දී වැය කර තිබූ රු.3,700,000 ක් හා රු.392,500 ක් වටිනා ඉඩම් කොටස් 05 ක වටිනාකම ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ආ) ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගත කළයුතු රු.137,900 ක් වටිනා වත්කම් විෂයයන් 09 ක් පොදු ගබඩා හා ක්ෂේත්‍ර ගබඩා ලෙස ජංගම වත්කම් යටතේ ගිණුම්ගත කර තිබුණි.

(ඇ) රණවිරු පෙර පාසල සංවර්ධනය කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේ රු.700,000 ක වටිනාකමකට කොන්ත්‍රාත්කරුවෙකු සමග ගිවිසුම්ගත වී ඇතත්, සමාලෝචිත වර්ෂය අවසාන දිනට ගෙවීම් කර නොමැතිවීම හේතුවෙන් එම මුදල ණයහිමියන් ලෙස දැක්වියයුතු වුවත්, එය රු.496,000 ක් ලෙස ගිණුම්ගත කිරීම නිසා, ණයහිමියෝ රු.204,000 ක් අඩුවෙන් දැක්වුණි.

(ඇ) රු.101,400 කට මිල දී ගෙන තිබූ පුස්තකාල පොත් පුනරාවර්තන වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඉ) ජල ගබඩා ලේඛනයේ සඳහන් ජල උපකරණ ඒකක 223 ක වටිනාකම ගණනය කර ගිණුම්ගත කර නොතිබුණි.

(ඊ) කඩ කාමර 92 ක් ඉදි කිරීම සඳහා ටෙන්ඩර් කැඳවා ඉදි කිරීම සඳහා දැරියයුතු මුදලක් ලෙසින් අදාළ අයදුම්කරුවන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දී ලබා ගෙන තිබූ එකතුව රු.17,551,000 ක් වූ මුදල් පුනරාවර්තන ආදායම් යටතේ ගිණුම්ගත කර තිබුණි.

### 1.3.2 ලැබිය යුතු ගිණුම්

2015 දෙසැම්බර් 31 දිනට ලැබියයුතු ගිණුම් ශේෂ 09 ක එකතු වටිනාකම රු.44,829,373 ක් වූ අතර, එයින් අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂ එකතුව රු.27,644,704 ක් වී තිබුණි.

### 1.3.3 ගෙවිය යුතු ගිණුම්

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවියයුතු ගිණුම් ශේෂ 03 එකතු වටිනාකම රු.36,622,023 ක් වූ අතර, එයින් අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂවල එකතුව රු.24,256,427 ක් වී තිබුණි.

### 1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

ගිණුම් විෂයයන් 06 කට අදාළ අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම හේතුවෙන්, එකතුව රු.8,064,895 ක් වූ ගනුදෙනු විගණනයේ දී සතුටුදායක ලෙස සත්‍යාක්ෂණය කිරීමට නොහැකි විය.

### 1.3.5 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම්.

පහත සඳහන් අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය කරනු ලැබේ.

| | නීති, රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත. | |
| | 19(1)(i) | පළාත් පාලන කොමසාරිස්වරයාගේ අනුමැතියකින් තොරව සේවකයින් 10 දෙනෙකු සේවයේ යොදවා ගෙන සමාලෝචිත වර්ෂයේ මැයි සිට දෙසැම්බර් දක්වා කාල පරිච්ඡේදය සඳහා වැටුප් හා දීමනා ලෙස රු.1,996,358 ක් ගෙවා තිබුණි. |

| | | |
|---|---|---|
| (ආ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති.<br>---------------------------------------- | |
| | 218 | සභාව සතු සියලු ඉඩම් හා ගොඩනැගිලි වාර්ෂිකව පරීක්ෂා කරවීමට කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | චක්‍රලේඛ.<br>------------ | |
| | 1980 දෙසැම්බර් 31 දිනැති අංක 1980/46 දරන පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛය. | සභා බල ප්‍රදේශයේ පිහිටි කඩ කාමර 40 ක් දීර්ඝ කාලීනව බදු දී තිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

------------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම රු.20,519,546 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම රු.2,652,343 ක් වූයෙන්, මූල්‍ය ප්‍රතිඵලවල රු.17,867,203 ක වැඩි වීමක් දක්නට ලැබුණි.

### 2.2 ආදායම් පරිපාලනය

-----------------------

#### 2.2.1 ආදායම් රැස් කිරීමේ කාර්යය සාධනය

----------------------------------------

ලේකම්වරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබු ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | 2015.01.01 දිනට හිඟ ශේෂය | 2015 වර්ෂය බිල් කිරීම් | ලැබීම් 2015 වර්ෂයට බිල් කිරීම්වලින් ලැබීම් | හිඟයෙන් ලැබීම් | 2015.12.31 දිනටමුළු හිඟය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 2,393,847 | 1,525,921 | 906,368 | 479,966 | 2,533,434 |
| කුළී ආදායම් | 3,447,992 | 3,360,428 | 1,717,025 | 427,492 | 4,663,903 |
| බලපත්‍ර ගාස්තු | 157,450 | 2,173,983 | 2,242,583 | 28,000 | 60,850 |
| වෙනත් ආදායම් | 4,522,404 | 5,404,136 | 1,114,916 | 2,261,395 | 6,550,229 |
| එකතුව | | | | | 13,808,416 |

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.13,808,416 ක මුළු ආදායමක් හිඟ හිට තිබුණි.

### 2.2.2 වරිපනම් බදු

------------

සමාලෝචිත වර්ෂයේ ආරම්භක දිනට රු.2,286,260 ක් වූ හිග ශේෂයක් පැවති අතර, බිල් කිරිම රු.1,483,338 ක් වී තිබුණි. මෙම ශේෂයන්ගෙන් වර්ෂයේ අය කිරිම් ප්‍රතිශතය පිළිවෙළින් සියයට 18 ක් හා සියයට 61 ක් විය. සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට රු.2,410,910 ක හිග ශේෂයක් පැවති අතර, එයින් වසර 05 ට වැඩි ශේෂය රු.1,265,800 ක් විය. සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රජයේ ආයතනවලින් අය වියයුතු රු.87,725 ක ශේෂයක් ද පැවතුණි.

### 2.2.3 බදු කුළී

---------

(අ) සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට රු.4,663,903 ක හිග ශේෂයක් පැවති අතර, එම ශේෂයෙහි වර්ෂ 05 කට පෙර සිට පවතින රු.824,229 ක හිග ශේෂයක් ද ඇතුළත් වී තිබුණි. මෙම හිග මුදල් අය කර ගැනීම දුර්වල මට්මටක පැවතුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට රෝහල වටරවුම් පාර කඩ කාමර වලින් රු.748,652 ක හිග බදු ශේෂයක් පැවති අතර, මෙම ශේෂය තුළ ඉකුත් වර්ෂවලට අදාළව අය වියයුතු මුදල රු.656,472 ක් විය. මේ සම්බන්ධව බදු ගිවිසුමේ 04 ඡෙදය ප්‍රකාරව විධිමත් ක්‍රියාමාර්ගයන් අනුගමනය කර නොතිබුණි.

(ඇ) ආර්ථික මධ්‍යස්ථානයේ කඩ කාමර 25 න් 18 ක්ම මුල් බදුකරුවන් විසින් අතුරු බදු දී තිබූ අතර, ඒ සම්බන්ධයෙන් අදාළ ගිවිසුම්වල 17 වගන්තිය ප්‍රකාර කටයුතු කර නොතිබුණි.

(ඈ) ආර්ථික මධ්‍යස්ථානයේ සභාව සතු කඩ කාමරවල සභාවේ අනුමැතියකින් තොරව බදුකරුවන් විසින් විටින් විට ඉදි කිරීම් කර තිබූ අතර, කඩ කාමර විවිධ වෙනස්කම්වලට භාජනය කර තිබුණි. මේ සම්බන්ධව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමකින් තොරව එකී කඩ කාමරවල බදුකරුවන්ට ආර්ථික වාසියක් සැළසෙන පරිදි බදුකරු මුදල් වැය කර කළ ඉදි කිරීම් වෙනුවෙන් යැයි සදහන් කර තක්සේරුගත බදු කුළී අඩු කර අය කිරීමේ ක්‍රමයක් අනුගමනය කර තිබුණි.

### 2.2.4 බලපත්‍ර ගාස්තු.

------------------

ඉකුත් වර්ෂයට අදාළ රු.60,850 ක බලපත්‍ර ගාස්තු ආදායමක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**2.2.5 වෙනත් ආදායම්.**

**(අ) අක්කර බදු.**

සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට රු.122,524 ක හිග ශේෂයක් පැවති අතර, එම ශේෂයෙහි වර්ෂ 05 ක කාලයක් ඉක්මවා තිබූ රු.48,274 ක් පැවති අතර, මෙම හිග මුදල් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**(ආ) ජල ගාස්තු.**

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.1,145,630 ක හිග ශේෂයක් පැවති අතර, ඉන් වසර 05 ක් ඉක්ම වූ හිග ශේෂය රු.309,184 ක් විය. රජා ආයතනවලින් අය වියයුතු රු.62,065 ක ශේෂයක් ද ඊට ඇතුළත් වී තිබූ අතර, මෙම හිග මුදල් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**(ඇ) දැන්වීම් පුවරු ගාස්තු.**

2014 දෙසැම්බර් 05 දිනැති අංක 1892 දරන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් නිවේදනය මගින් ප්‍රකාශිත පරිදි දැන්වීම් පුවරු සඳහා වන ගාස්තු සභාව මගින් නිසි පරිදි අය කර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි. නියැදියක් ලෙස ප්‍රධාන මාර්ගයේ කරල්ලියද්ද නගරයේ ඔරලෝසු කණුව සිට විල් අමුණ දක්වා වූ කොටස් හී 2015 ඔක්තෝම්බර් 22 දින කළ ක්ෂේත්‍ර පරීක්ෂාවේ දී දැන්වීම් පුවරු 69 කින් රු.107,354 ක් අය කර ගෙන නොතිබුණි.

**(ඈ) ත්‍රී රෝද රථ ගාස්තු.**

ත්‍රී රෝද රථකරුවන් 218 කගෙන් රු.1,239,820 ක ගාස්තු අය කර ගැනීමට කටයුතු කර නොතිබූ අතර, එම ගාස්තු ගෙවීම පැහැර හැර තිබූ ත්‍රී රෝද රථකරුවන් සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් අනුගමනය කර නොතිබුණි.

**2.2.6 උසාවි දඩ හා මුද්දර ගාස්තු.**

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2015 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ රු.476,326 ක් හා මුද්දර ගාස්තු රු.4,928,273 ක් ලැබියයුතුව තිබුණි.

**2.2.7 සති පොළ ගාස්තු.**
**-------------------**

(අ) තෙල්දෙණිය නගරයේ මහජන බැංකුව පිටුපස ඇති රථ ගාලේ පවත්වා ගෙන යනු ලබන සති පොළෙහි 2015 ජනවාරි සිට දෙසැම්බර් දක්වා වූ කාලයට අදාළව ගාස්තු එකතු කිරීමේ අයිතිය රු.1,204,575 ක මුදලකට ගිවිසුම්ගතව පෞද්ගලික පාර්ශවයකට පවරා දී තිබුණි. ගිවිසුමේ කොන්දේසිවලට අනුව, සති පොළ පවත්වන දින 02 සඳහා පමණක් ගාස්තු අය කර ගතයුතු වුව ද, සතියේ සියලුම දිනයන් සඳහා එහි වෙළඳාම් කටයුතුවලට ඉඩ දී දෛනිකව පොළ ගාස්තු අය කරමින් තිබූ අතර, ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන ගේට්ටුව දෙපස හා පදික වේදිකාවෙහි දෛනිකව වෙළඳාම් කටයුතුවල නිරත සියලුම වෙළඳුන්ගෙන් සතියේ සියලුම දිනයන්වල දී බදුකරු විසින් දෛනිකව ගාස්තු අය කරමින් තිබුණි.

(ආ) සති පොළ පැවැත්වීම සඳහා මහවැලි අධිකාරියෙන් සභාව වෙත ලබා දී තිබූ ඉඩමේ මෙතෙක් පවත්වා ගෙන ආ තෙල්දෙණිය නව නගරයේ පැරණි සති පොළ ඉවත් කර කඩ කාමර සහිත ගොඩනැගිල්ලක් ඉදි කිරීමට කටයුතු කරමින් තිබුණි. කඩ කාමර සඳහා ටෙන්ඩර් පරිපාටිය අනුගමනය කිරීමකින් තොරව අවිධිමත් ලෙස තෝරා ගෙන තිබූ බදුකරුවන් 112 දෙනෙකු අතුරින් 99 දෙනෙකුගෙන් රු.30,000 සිට රු.550,000 ක් දක්වා පෙර බදු මුදලක් අය කර ගෙන තිබූ අතර, 08 දෙනෙකු මුදල් ගෙවීම පැහැර හැර තිබුණි. කඩ කාමර 04 ක ඉල්ලුම්කරුවන් කඩ කාමර ලබා ගෙන නොමැති බව තහවුරු වූ අතර, පෙර බදු මුදල් අය කිරීමෙහි නිසි ක්‍රමවේදයක් ද නොවීය.

**3. මෙහෙයුම් සමාලෝචනය**
**--------------------------**

**3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා**
**----------------------------**

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) 2008, 2010 හා 2011 වර්ෂයන්ට අදාළව මෙතෙක් නිරවුල් කිරීමට කටයුතු නොකළ තැන්පත් ගිණුමේ දැක්විය යුතු රු.628,805 ක රැඳවුම් මුදල් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වූ ණයගැති ශේෂය තුළ ඇතුළත් කර තිබුණි. එසේම, එම රැඳවුම් මුදල් නිරවුල් කිරීමට ද කටයුතු කර නොතිබුණි.

(ආ) සේවය හැර ගිය, විශ්‍රාම ගිය හා ස්ථාන මාරු වී ගිය නිලධාරීන් 13 දෙනෙකුගෙන් අය වියයුතු රු.34,101 ක හිඟ ණය ශේෂය අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3.2 හඳුනා ගත් අලාභ.**

2014 හා 2015 වර්ෂයන්ට අදාළව රු.172,555 ක් වටිනා පුස්තකාල පොත් 1757 ක ඌණතාවයක් අනාවරණය වී තිබුණි.

**3.3 කොන්ත්‍රාත් පරිපාලනය.**

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

**(අ) ගල්කොටුව බහුකාර්ය මධ්‍යස්ථානය ගොඩනැගිල්ල ඉදි කිරිම**

රු.490,000 ක් වැය කර ඉදි කළ ගල්කොටුව බහුකාර්ය මධ්‍යස්ථාන ගොඩනැගිල්ලේ බිත්ති සඳහා අනුමැතියකින් තොර අගල් 8 ½ x 5 ½ x 2 ½ ප්‍රමාණයේ ගඩොල් යොදා තිබූ අතර, වහලයේ ඇස්තමේන්තුගත දැව තලාද (Beams) වෙනුවට කොන්ක්‍රීට් තලාද යොදා තිබූ අතර, වැඩ විෂයය අංක 07 යටතේ වහළයේ සමහර ස්ථානවලට පාවිච්චි කර තිබූ දැව යොදා තිබුණි. මේ සඳහා දැව ආරක්ෂණ ආලේපය නිසි පරිදි යොදා නොතිබුණි. ඉදි කිරීම් කටයුතු සඳහා මඩ සහිත වැලි භාවිතා කර තිබූ අතර, ගොඩනැගිල්ලේ බිත්තිවලට යොදා තිබූ, බදාම මිශ්‍රණය ඉතා දුර්වල තත්ත්වයේ පැවතිණි.

**(ආ) රඹුක්වැල්ල අදානාගාරය ඉදි කිරිම.**

පුර නැගුම ව්‍යාපෘතිය යටතේ ඉදි කිරීමට සැළසුම් කළ රඹුක්වැල්ල ආදාහනාගාරයේ ඉදි කිරීම් ප්‍රදේශවාසීන්ගේ විරෝධතාවය හේතුවෙන් අත් හිටුවා තිබූ අතර, ප්‍රදේශවාසීන්ගේ අවශ්‍යතාවය විමසා බලා කටයුතු නොකිරීම හේතුවෙන්, කොන්ත්‍රාත් සමාගමට ලේඛනමය කටයුතු වෙනුවෙන් ගෙවූ රු.99,481 ක මුදල සභා අරමුදලට පාඩුවක් වී තිබුණි.

**3.4 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය.**

දෛනිකව ජනනය වන ඝණ අපද්‍රව්‍ය ටොන් 04 ක් පමණ තෙල්දෙණිය පොදු ක්‍රීඩාංගණය අසළ මහවැලි අධිකාරිය සතු ඉඩමකට නිසි ක්‍රමවේදයකින් තොරව බැහැර කර පස් දමා වසා දැමීම සිදු කර තිබුණි.

## 4. යහපාලනය හා ගිණුම් කටයුතු භාවය.

### 4.1 අයවැය පාලනය.

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුළ දී, වියදම් විෂයයන් අතර ප්‍රතිපාදන මාරු කිරීමෙන් අනතුරුව ද අයවැයගත හා තථ්‍ය වියදම් අතර වැය විෂයයන් 47 ක සියයට 15 සිට සියයට 99 දක්වා ද, ආදායම් විෂයයන් 29 ක සියයට 20 සිට සියයට සියය ඉක්මවා ද, සැළකියයුතු විචලනයක් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණි.

(ආ) වැය විෂයයන් 12 ක රු.918,160 ක් වූ අයවැයගත ප්‍රතිපාදන සම්පූර්ණයෙන් ඉතිරි කර තිබූ අතර, රු.260,000 ක් වූ ආදායම් විෂයයන් 03 කින් කිසිදු ආදායමක් උපයා ගෙන නොතිබුණි.

### 4.2 වාර්ෂික ප්‍රසම්පාදන සැළැස්ම.

සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි.

### 4.3 අභ්‍යන්තර විගණනය.

ආයතනය තුළ ප්‍රමාණවත් හා ස්වාධීන අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි.

### 4.4 වත්කම් කළමනාකරණය.

**නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්.**

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) රු.1,724,000 ක් වටිනා වාහන හා යන්ත්‍ර විෂයයන් 05 ක් නිෂ්ක්‍රීයව හා ඌණ උපයෝජිතව පැවතුණි.

(ආ) සභා ගොඩනැගිල්ලෙන් හා තෙල්දෙණිය බස් නැවතුම් පොළෙන් ගලවා ඉවත් කරන ලද ගණනය නොකළ සෙවිලි උළු විශාල තොගයක් සුදුසු කටයුත්තක් සඳහා යොදා නොගෙන අනාරක්ෂිතව සභා භූමියේ තැනින් තැන ගොඩ ගසා තිබුණි.

**5.** **පද්ධති හා පාලනය.**

**-----------------------**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) අභ්‍යන්තර පාලනය

(ඇ) ආදායම් පරිපාලනය

(ඈ) ණයගැති/ණයහිමි පාලනය

(ඉ) වත්කම් කළමනාකරණය

(ඊ) තොග පාලනය

(උ) කොන්ත්‍රාත් පාලනය